# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TOD/D/CMS/2010
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2010.10.29

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ 5/2010

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

<u>රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ගෙවීම සඳහා දැනට ක්‍රියාත්මක වන මුදල් ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම</u>

මහා භාණ්ඩාගාරය විසින් නියම කර ඇති දිනයන්ට වැටුප් ගෙවීමට අවශ්‍ය ද්‍රවශීල මුදල් අවම පිරිවැයෙන් අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන වල නිල බැංකු ගිණුම් වලට ප්‍රේෂණය කිරීම පිණිස දැනට පරිගණකගත බැංකු ජාලය උපයෝගී කරගෙන භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක වේ.

02. රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන පරිගණක වැඩසටහන (GPS) වැටුප් ගෙවීම ඉක්මනින් හා කාර්යක්ෂමව කිරීමටත්, කළමණාකරන තොරතුරු උත්පාදනය කිරීමටත් පහසුකම් සලසා ඇත. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන සියළුම ගෙවීම් කාර්යාල මෙම වැඩසටහන උපයෝගී කරගෙන වැටුප් සකස් කරනු ලැබුවද වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය වන ද්‍රවශීල මුදල් ප්‍රමාණය නිවැරිදිව ගණනය නොකෙරෙන අවස්ථාද, වැටුප් ගෙවීමට නියම කරන ලද දිනයන්ගෙන් බැහැරව විධිමත් අනුමැතියකින් තොරව කලින් වැටුප් ගෙවන අවස්ථාද අනාවරණය වී ඇත.

03. දැනටමත් බොහොමයක් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සිය ගෙවීම් කාර්යාල මගින් වැටුප් ගෙවීමේදී සම්ප්‍රදායිකව අනුගමනය කරන පිළිවෙතින් බැහැරව වැටුප් මුදලින් ගෙවීම වෙනුවට බැංකු ගිණුමකට නියමිත දිනට ප්‍රේෂණය කිරීම මගින් ආරක්ෂිතව හා සකසුරුවමින් සිය වේතනය කළමනාකරණය කිරීමට රාජ්‍ය නිලධාරීන්ට අවස්ථාව උදාකර දී ඇත. එබැවින් මෙතෙක් බැංකු ගිණුම් මාර්ගයෙන් වැටුප් ගෙවීම සිදු නොකරන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මෙම පහසුකම කෙරෙහි සිය කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ අවධානය යොමුකර, බැංකු ගිණුම් මාර්ගයෙන් වැටුප් ලබා ගැනීමට ඔවුන් දිරිමත් කළයුතුව ඇත.

04. රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රවාහ අවම පිරිවැයෙන් යුතුව කළමනාකරණ කිරීම සඳහා ඔබ ආයතනයේ නිලධාරීන්ට තත්‍ය වශයෙන් කරන ලද වැටුප් ගෙවීම පිළිබඳ විස්තර මාසිකව ලබාගැනීමට අවශ්‍ය වී ඇත. එබැවින් රජයේ වැටුප් පරිගණක වැඩසටහන (GPS) යටතේ මාසිකව වැටුප් සකස් කිරීමේදී ලබාගත හැකි <u>වැටුප් ගෙවීම් හා සේවක සංඛ්‍යා වාර්තාව</u> (Salary Payment & Carder Report ) සහ <u>වැටුප් සාරාංශ වාර්තාව</u> පහත සඳහන් පරිදි විද්‍යුත් තැපැල (E-mail) මගින් අදාල මාසයට පසු මාසයේ 15 දිනට හෝ ඊට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට එවීමට වගබලා ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| නිලධාරියාගේ නම හා තනතුර | අංශය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|
| ටි. නලින් ඔපන් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | ජාතික ආරක්ෂාව, යුක්තිය පසඳලිම සහ නිතිය බලාත්මක කිරීම | nalino@tod.treasury.gov.lk |
| එස්. ජේ. එස්. වික්‍රමරත්න මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | යටිතල පහසුකම් සංවර්ධනය.<br>සමාජ ආරක්ෂණය, ජීවනෝපාය හා ප්‍රාදේශීය සංවර්ධනය | wickramas@tod.treasury.gov.lk |
| පී.ඩී.එන්.පී.ධර්මරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | රාජ්‍ය පරිපාලනය,මෙහෙයුම් සහ නියාමනය | nayanap@tod.treasury.gov.lk. |

| | | |
|---|---|---|
| එම්.ජී.බී.එල්.මනෝහරී මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂිකා | මානව සම්පත් සංවර්ධනය, කලාව ආගම සහ සංස්කෘතික කටයුතු, විද්‍යා හා තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධනය | manoharib@tod.treasury.gov.lk. |
| කේ. එස්. දයාරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | නිෂ්පාදන , සේවා සහ පරිසරය | sajeevani@tod.treasury.gov.lk. |

**05.** තිල බැංකු ගිණුම් වලට වැටුප් ගෙවීම සඳහා මුදල් නිදහස් කිරීම සිදු කරනු ලබන්නේ එම වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව බැවින් වාර්තා ප්‍රමාදවීම වැටුප් මුදල් ප්‍රේෂණය ප්‍රමාදවීමට හේතුවනු ඇත. තවද ඔබ ආයතනයේ තිල බැංකු ගිණුමට මුදල් බැර වන්නේ වැටුප් ගෙවන දිනට පෙර දිනයේ බැවින් මෙම කාලය ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ බව හා එයට හේතු පැහැදිලි කර එම දිනයේ වෙනසක් සිදු කර ගැනීමට කටයුතු කල හැකි බව ද දැනුම් දෙමි.

*06.* මෙම චක්‍රලේඛයේ උපදෙස් *2011.01.01* දින සිට ක්‍රියාත්මක වනු ඇත.

පී.බී.ජයසුන්දර
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හා
භාණ්ඩාගාරයේ ලේකම්.

පිටපත : විගණකාධිපති